# බොයිලර් ක්‍රියාකරු තනතුර.

## සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.

සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති බොයිලර් ක්‍රියාකරු තනතුර සඳහා සුදුසුකම්ලත් සමිති බල ප්‍රදේශයේ වසර 02ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2024.03.04 දින සිට 2024.03.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීමේ දී, සමුපකාර සේවක කාර්ය විධිවිධාන 1.2.2 වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින් හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

| තනතුර | වැ.ප අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| බොයිලර් ක්‍රියාකරු (විශේෂ) තනතුර104.9 වැ.ප.III ශ්‍රේණියේ තනතුර. | 104.9 වැ.ප.III ශ්‍රේණියේ | 01 | 21,284-575x10-675x10-800x10=41,784<br>ආරම්භක මූලික වැටුප රු. 21,284/= ක් වන අතර එයට අමතරව වැටුපින් 15% ක දීමනාව සහ රු.2,500/= ක දීමනාව ද හිමිවේ. |

2. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

3. බඳවා ගැනීමේ සුදුසුකම් :-

අ. 105.11 වැටුප් පරිමානයේ ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර 06කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ 105.10 වැටුප් පරිමානයේ ක්ෂේත්‍රයට අදාල තනතුරක වසර 04ක නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ,

ආ. අ:පො:ස: (සා.පෙ) විභාගයෙන් සම්මාන 03ක් සමග ගණිතය, සිංහල, ඇතුලුව විෂයන් 06කින් සමත්වීම හෝ සමුපකාර ස/පෙළ සමත්වීම සමග බොයිලේරු ක්‍රියාකරවීම පිළිබඳ පුහුණු සහතිකය සහ රජය පිළිගත් ආයතනයක වසර 01කට නොඅඩු බොයිලේරුකරුවකු වශයෙන් සතුටුදායක සේවා පලපුරුද්දක් ලබාතිබීම.

4. වයස් සීමාව:- අවු. 24ත් 45 ත් අතර විය යුතුය.
(අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස සඳහන් කළ යුතුය).
සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ලබයි.

5. බඳවා ගැනීමේ ක්‍රමය:- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

6. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවාගැනීමේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේ දී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත හෝ ලබා දී ඇති පත්වීම අවලංගු කළ හැකිය.

7. වෙනත් සමුපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතු වේ. වෙනත් සමිතියක සේවකයෙකු සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.

8. අයදුම්පත්‍රය යොමු කිරීම:-

i. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ “සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ බොයිලර් ක්‍රියාකරු තනතුර” සඳහා බඳවා ගැනීම යන්න” සඳහන් කළ යුතුය.

ii. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024.03.25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට ද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

සභාපති

සභාපති
සී/ස දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය,
දූනාගහ.

2024.02.29 දිනදීය.